www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ සසප-සසජාශි රැස්වීමක්: රුසියානු විප්ලවයේ පාඩම්

## SEP-ISSE meeting in Sri Lanka: the lessons of the Russian Revolution

**2007 නොවැම්බර් 21**

සමාජවාදී සමානතා පක්ෂය (සසප) සහ සමාජ සමානතාව සඳහා ජාත්‍යන්තර ශිෂ්‍යයෝ (සසජාශි) රුසියානු විප්ලවයේ 90 වන සංවත්සරය සමරනු වස් නොවැම්බර් 25 දා කොලඹ දී ප්‍රසිද්ධ රැස්වීමක් පවත්වනු ඇත.

ඔක්තෝබර් 25 දා (බටහිර දින දර්ශනයට අනුව නම් නොවැම්බර් 7) රුසියානු කම්කරු පන්තිය, බොල්ෂෙවික් පක්ෂයේ නායකත්වය යටතේ, දශ ලක්ෂ සංඛ්‍යාත ගොවි ජනතාවගේ ද සහයෝගය ඇතිව, බලය ගෙන, පලමු වන අධිරාජ්‍යවාදී ලෝක යුද්ධයේ එරි තිබූ ධනපති ක්‍රමයට සමාජවාදී විකල්පයක් ගොඩනැගුවේ ය. එය විසි වන සියවසේ ශ්‍රේෂ්ඨතම දේශපාලන සිද්ධිය බවට කිසිදු සැකයක් නැත.

ඔක්තෝබර් විප්ලවයේ පාඩම් අධ්‍යයනය කිරීමේ අවශ්‍යතාව අවධාරනය කරමින්, ලෙනින් සමග එම විප්ලවයේ සම-නායකත්වය දැරූ ලියොන් ට්‍රොට්ස්කි, *The History of the Russian Revolution* (රුසියානු විප්ලවයේ ඉතිහාසය) නම් වූ සිය සම්භාවනීය කෘතියේ මෙසේ ලිවී ය: "1917 වසරේ ප්‍රථම මාස දෙක තුල දී රුසියාව ඒ වන විටත් රොමනොව් රාජාන්ඩුවක්ව පැවතුනි. මාස අටක් ඇවෑමෙන් බොල්ෂෙවික්වරු එහි මුදුනත නැගී සිටියහ. වසර ආරම්භ වන විට ඔවුන් ගැන කිසිවකු එතරම් දැන සිටියේ නැත. ඔවුන් බලයට එන විටත් ඔවුන්ගේ නායකයන් සිටියේ රාජ ද්‍රෝහිත්වය පිලිබඳ චෝදනා යටතේ ය. ඉතිහාසයේ එවන් තියුනු හැරීමක් ඔබට සොයා ගත නොහැකි වනු ඇත -- විශේෂයෙන් ම එය මිලියන 150ක ජනගහනයෙන් යුත් ජාතියක් සම්බන්ධයෙන් ය යන්න මතක් කර ගත හොත් එය එසේ ම වනු ඇත."

1917 විප්ලවය සිදු කල හැකි වූයේ, කම්කරු පන්තිය තුල සමාජවාදී සංස්කෘතියේ වර්ධනය සඳහා, මාක්ස්වාදී ව්‍යාපාරය විසින්, විශේෂයෙන් ම රුසියානු මාක්ස්වාදීන් විසින්, වෙහෙස නොබලා ගෙන යන ලැබූ දශක ගනනාවක න්‍යායික හා දේශපාලනික වැඩකටයුතු නිසාම පමනි. රුසියානු විප්ලවයේ මෙන් ම දිග්ගැසුනු ස්ටැලින්වාදී පරිහානියේ හා 1991 සෝවියට් සංමගය අවසන් වසයෙන් බිඳවැටීමේ ද පාඩම් අද කම්කරුවන් හා තරුනයන් සඳහා ප්‍රගාඪ අර්ථභාරයක් දරයි.

විසි වන සියවස ආරම්භයේ දී යුද්ධය හා විප්ලවය නිර්මානය කල ලෝක ධනවාදයේ අතිමූලික ප්‍රතිවිරෝධතාවන්ගෙන් එකක් වත් විසඳනු ලැබ නැත. මිලිටරි විධික්‍රම මගින් සිය ගෝලීය ආධිපත්‍යය තහවුරු කර ගැනීමට එක්සත් ජනපදය ගෙන ඇති ප්‍රයත්නය ලෝකය තවත් යුද ගිනි මැලයක් දෙසට තල්ලු කරයි. පවත්නා එක ම විකල්පය නම් යලිත් වරක් මිලේච්ඡත්වය ගෙන ඒමට තර්ජනය කරන සමාජ පර්යාය අහෝසි කිරීම යි. කම්කරුවන්ගේ හා තරුනයන්ගේ වත්මන් පරම්පරාව අභිමුඛව පවත්නා විප්ලවවාදී අභියෝගය එය යි.

**ප්‍රධාන කතිකයා: සසප ප්‍රධාන ලේකම් හා ලෝක සමාජවාදී වෙබ් අඩවියේ ජාත්‍යන්තර කර්තෘ මන්ඩලයේ සාමාජික විජේ ඩයස්**

**ස්ථානය: අවිස්සාවේල්ල රාජ්‍ය සේවා ක්‍රීඩා සමාජ ශාලාව (පීඑස්සී)**

**වේලාව: නොවැම්බර් 25 වන ඉරිදා සවස 3.30**

© www.wsws.org